1


1.2 විශේෂාංග රූප සටහන

## කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ අන්තර්ගත භාණ්ඩ හා සේවා කාණ්ඩයන්හි මිල පීඩන ව්‍යාප්තිය

මෙහි ඉදිරිපත් කර ඇති විවිධ වර්ණ රූප සටහන මගින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද.) ප්‍රධාන කාණ්ඩයන්හි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 වසරේ සිට වෙනස් වූ ආකාරය නිරූපණය කෙරේ. මෙහි ඇති වර්ණ අනුක්‍රමණය මගින් මිල වෙනස්වීම්හි තීව්‍රතාවය නිරූපණය වන අතර, එහිදී උණුසුම් වර්ණ මගින් (කහ සිට තද රතු දක්වා) ඉහළ උද්ධමන පීඩන ද, කොළ වර්ණය මගින් 5%ක ඉලක්කය ආසන්නයේ උද්ධමනය පැවතීම ද, ලා නිල් වර්ණය මගින් අවධමන කාලසීමාවන් ද පෙන්නුම් කෙරේ. මේ අතර, එක් එක් කාණ්ඩයේ උස මගින් සාපේක්ෂව කාණ්ඩයක පදනම් වර්ෂයේ බර තැබීම නිරූපණය වේ. මෙවන් ඉදිරිපත් කිරීමක් මගින් මානයන් තුනක් ඔස්සේ උද්ධමනය පිළිබඳ දැන ගැනීමට අවකාශ සලසයි; එනම්, එක් එක් කාණ්ඩයන්හි මිල පීඩනයන්ගේ දිශානතිය හා තීව්‍රතාවය පෙන්වීම, සමස්ත උද්ධමනය කෙරෙහි වැඩි බලපෑම් ඇති කරන අයිතමයන් පිළිබඳ අනාවරණය කිරීම, සහ උද්ධමනය පුළුල් ලෙස සෑම කාණ්ඩයකම ව්‍යාප්ත වී පවතී ද නැතහොත් කිසියම් සීමිත කාණ්ඩයක් හේතුවෙන් ඇතිවන්නක් ද යන්න නිරූපණය කිරීමයි.

2021 වසරේ මුල් භාගයේ දී, බොහෝ කාණ්ඩයන්හි උද්ධමනය 5%ක ඉලක්කය ආසන්නයේ පාලනය වී පැවතුණි. කෙසේ වෙතත්, 2022 වසරේ මුල් භාගයේ සිට 2023 වසරේ මැද භාගය දක්වා බොහෝ කාණ්ඩයන්හි උද්ධමනය ඉතා වේගයෙන් ඉහළ ගිය අතර, ආර්ථික අර්බුදය මධ්‍යයේ 'ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග', 'ආපනශාලා සහ හෝටල්' සහ 'ප්‍රවාහන' යන කාණ්ඩයන්හි වඩාත් තීව්‍ර මිල පීඩන වාර්තා විය. කාණ්ඩයන් අනුව හැසිරීමේ කාල පරාස සහ එම ප්‍රමාණයන් එකිනෙකට වෙනස් වුවද, සාර්ව ආර්ථික තත්ත්වයන් යහපත් වීමත් සමඟ, ඉන් පසුව උදාවූ කාලසීමාව තුළ ක්‍රමයෙන් මෙන්ම පුළුල් ලෙස

### මතුපිට උද්ධමනයේ විවිධ වර්ණ රූප සටහන (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)




සටහන:

1. 2023 ජනවාරි මාසයට පෙර දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ.
2. කො.පා.මි.ද. (2021=100) මත පදනම්ව, වරහන් තුළ පදනම් වර්ෂයේ බර තැබීම් සඳහන් කර ඇත. උස මගින් සාපේක්ෂව කාණ්ඩයක පදනම් වර්ෂයේ බර තැබීම නිරූපණය වේ (සියලු අයිතමයන් අවස්ථාවේ දී හැර).
3. දකුණු පස ඇති පරිමාණය මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය නිරූපණය වන අතර, එහිදී 5%ක උද්ධමන ඉලක්කයට ආසන්න අගයන් කොළ වර්ණයෙන් දක්වා ඇත. උද්ධමනය ඉහළ යන විට, එහි වර්ණය කොළ වර්ණයේ සිට කහ වර්ණය දක්වා ද, ඉන් අනතුරුව උද්ධමනය තීව්‍ර ලෙස ඉහළ යන විට ලා රතු සහ තද රතු වර්ණයන් දක්වා ද වෙනස් වේ. 5%කට වඩා අඩු උද්ධමන මට්ටම් කොළ වර්ණයේ සිට නිල් වර්ණය දක්වා වෙනස් වීමෙන් නිරූපණය වන අතර, වඩාත් තද නිල් පැහැති වර්ණ මගින් ඉහළ අවධමන තත්ත්වයන් පෙන්නුම් කරයි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

# 1

නිර්-උද්ධමන ප්‍රවණතාවක් දක්නට ලැබුණි. මේ හා සැසඳීමේ දී, 2024-2025 කාලසීමාව තුළ දක්නට ලැබුණු අවධමන තත්ත්වය, සමස්ත ආර්ථිකය පුරා ව්‍යාප්ත වූ මිල පහත වැටීමකට වඩා, ප්‍රධාන වශයෙන් 'නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන' මෙන්ම 'ප්‍රවාහන' වැනි ඉහළ බර තැබීමක් සහිත කාණ්ඩ හේතුවෙන් සිදු වූවකි. මෑතකාලීනව, බොහෝ කාණ්ඩයන්හි නැවත කොළ වර්ණය දිස්වීම මගින් මිල පීඩනයන් සාමාන්‍ය තත්ත්වයට පත්වීම සහ සමස්ත මිල ස්ථායීතාවක් කරා නැවත පැමිණීම පෙන්නුම් කරයි.